www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලාංකික මැතිවරනයේදී ගම්බද ජනයාගෙන් ප්‍රතිප්‍රහාරයක්

## Rural backlash in Sri Lankan elections

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**

**2004 අප්‍රේල් 10**

2001 දෙසැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති මහ මැතිවරනයේ දී මැතිවරන දිස්ත්‍රික්ක 22න් එකක් පමනක් ජයග්‍රහනය කරමින් සහ එහි ඡන්දවලින් සියයට 6ක් අහිමි කර ගනිමින් පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) මෙහෙයවූ සභාගය තියුනු පරාජයක් ලැබී ය. යන්තම් මාස 27කට පසුව අප්‍රේල් 2 පැවති මැතිවරනයේ දී, එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව, ජනතා විමුක්ති පෙරමුන සමග ශ්‍රීලනිපය ඇතිකරගෙන තිබෙන සභාගය අතින් එබඳුම පරාජයක් ලැබී ය.

එයට එරෙහිව සියයට පහත් හයත් අතර ප්‍රතිශතයකින් ඡන්දවල ඉහලයාමක් පෙන්නුම් කල විශේෂයෙන් ම දකුනු සහ මධ්‍යම පලාත්වල ග්‍රාමීය ප්‍රදේශවලදී එජාපෙට එරෙහි බරපතල විය. උතුරු මධ්‍යම පලාතේ අනුරාධපුර සහ පොලොන්නරුව දිස්ත්‍රික්කවලදී

එජාපෙ ඡන්ද පිලිවෙලින් 17,000 (6%) සහ 11,000 (7%) පහත වැටුනි. ඈත දකුනේ හම්බන්තොට දී එහි ඡන්ද 13,000 හෙවත් සියයට 5ක් පහත වැටුනි. එජාපෙ බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලැබූ බදුල්ලේදී 20,000 පමන හෝ සියයට 4න් එහි සංඛ්‍යාව අඩුවිය.

ඡන්දවල ක්ෂනික පැද්දීම ගොවීන්ගේ සහ ගම්බද දුගීන්ගේ ජීවන තත්වයන් විනාශ කරනු ලැබ ඇති ආර්ථික ප්‍රතිසංස්කරනයන් ක්‍රියාවට දැමීමට වගකිවයුතු ප්‍රධාන පක්ෂ දෙක වන ශ්‍රීලනිපය සහ එක්සත් ජාතික පක්ෂය කෙරෙහි මහජනතාව විරසක වීමක් සහ අවිශ්වාසය වර්ධනය වීමක් පිලිබිඹු කරයි. ශ්‍රීලනිපයට ඡන්ද ඉහල දමාගැනීමට හැකි වූයේ ජනතාවාදී වාචාල කථා සහ හිස් පොරොන්දුවල මිශ්‍රනයක් මගින් පුලුල්ව පැතිරී ඇති විරුද්ධත්වය ගසා කෑමට සමත්ව ඇති සිංහල ස්වෝත්තමවාදී ජවිපෙ සමග සන්ධානයක් හරහා පමනි.

පසුගිය වසර දෙක පුරා ගම්බද ප්‍රදේශවලට තදින් පහර වැදී තිබේ. තුනෙන් එකකින් සමෘධි සහනාධාර ගෙවීම් ලැබූ ජන සංඛ්‍යාව කප්පාදු කල එජාපෙ ආන්ඩුව මිල දෙගුනයකට වඩා ඉහල දමමින් පොහොර සහනාධාරය කැපීය. වගාවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය කරනු ලබන විවිධ කෘෂි රසායනික ද්‍රව්‍යවල මිල අවම වසයෙන් සියයට 45-50න් වැඩි කලේ ය. ඒ සමග ම සෞඛ්‍ය සහ අධ්‍යාපනය සේවාවන් සඳහා කෙරෙන වියදම් කප්පාදු කරනු ලැබ ඇත. විශාල වශයෙන් රැකියා අහිමිකිරීමට තුඩුදෙමින් රාජ්‍ය ආයතන සමාගම් බවට පරිවර්තනය කිරීම හෝ විකිනීම නිසා විරැකියාව ඉහල නැග ඇත.

ප්‍රධාන පක්ෂ කෙරෙහි ඔවුන්ගේ කෝපය හා විශ්වාසභංගය ප්‍රකාශ කල සහ ඔවුන් මුහුන දෙන දුෂ්කරතාව විස්තර කල ගම්බද ප්‍රදේශවල පුද්ගලයෝ ගනනාවක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* සම්මුඛ සාකච්ඡාවක් ලබා දුන්හ.

මධ්‍යම පලාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ නෙලුව දන්ඩේ තේවතු කම්කරුවකු වන 47 වියැති ගුනතිලක, ඔහු 2001 දී එජාපෙට ඡන්දය දුන් නමුත් මේ වතාවේ දී එජනිසට ඡන්දය දුන් බව *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසී ය. නව ආන්ඩුව යම් සහනයක් ලබා දෙනු ඇතැයි ඔහු බලාපොරොත්තු වූ නමුත් එය එසේ වේ යැයි ඔහුට විශ්වාස නැත.

"මගේ වැටුප ප්‍රමානවත් නොවුන නිසා මා දැන් කුඩා ඉඩම් කැබැල්ලක් (හෙක්ටයාර් 0.2) වගා කරනවා. මගේ බිරිඳ තවමත් වත්තේ වැඩ කරනවා. ඇගේ දෛනික වැටුප රුපියල් 114යි. නමුත් මාසයකට ඇයට වැඩ ලැබෙන්නේ දින 22යි. සමහරවිට ඊටත් අඩුයි. ඒනිසා ඇය මාසයකට උපයන්නේ රුපියල් 1,500ක් හෝ ඊට අඩු මුදලක්. ගොවිතැන දුෂ්කරයි. පොහොර, කෘෂි රසායන සහ බීජ මිල ඉහලනැගලා. දිනපතාම ජීවන වියදම ඉහල නගිනවා."

ගුනතිලකට දරුවෝ සතර දෙනෙක් සිටිති. ඔහුගේ වැඩිමහල් දියනිය කොලඹ ඇඟලුම් කම්හලක සේවය කරයි. ඇයට ලැබෙන්නේ ඉතා අඩු වැටුපකි. ඔහුගේ දෙවන දියනිය රැකියාව කල ඇඟලුම් කම්හල මාස තුනකට පෙර වසා දැමූ නිසා සෙසු කම්කරුවන් සමග ඇයගේ රැකියාවද අහිමිවිය.

ගුනතිලකගේ පවුලට මාසයකට රුපියල් 700ක සමෘද්ධි සහනාධාර ලැබුන නමුත් මෑත දී එය කපා දමනු ලැබීය. ගොවිතැනින් හෝ අනියම් රැකියාවලින් ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන්ට සරිලන ආදායමක් ඉපයීමට නොහැකි නිසා ගමේ බොහෝ පවුල් මෙම මුල්‍ය ආධාරය මත යැපෙති. පවුල් 50ක් පමන ජීවත්වන මෙම ගමේ සිට ප්‍රධාන මාර්ගයට ඒමට යමෙකු කිලෝමීටරයකට ආසන්න දුරක් පයින් යා යුතු ය. ගමේ පැවති එක් කුඩා පාසලක් එජාපෙ ආන්ඩුව විසින් වසා දමනු ලැබී ය. කිලෝමීටර් තුනක් පමන දුරින් පිහිටි වෙනත් පාසලකට ළමුන් දැන් යා යුතු ය.

ගාලු දිස්ත්‍රික්කයේ ගලගොඩ පැල්පත් තුල ජීවත්වන පවුල් කිහිපයක් සමග *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කථා කලා ය. ඔවුන් එහි පදිංචියට පැමින ඇත්තේ ඔවුනට ඉඩම් නොතිබුන අසල ගම්වලිනි. කටුමැටි ගැසූ වරිච්චි බිත්ති සහිත ඔවුන්ගේ නිවෙස්වල වහලවල් හෙවිලි කර ඇත්තේ තාරසීට්වලිනි. එහි ඉඩපහසු කාමරයක් නැත. වැරැන්ඩාවක් කුඩා කාමරයක් සහ කුස්සියක් පමනක් ඇත. ඔවුන්ගේ නිවෙස්වලට ප්‍රධාන මාර්ගයේ සිට කිලෝමීටර් තුනක් පයින් ගමන් කල යුතු ය.

තිස් දෙහැවිරිදි රංජනී ජීවිකාව ගෙවන්නේ කොහු ලනු ඇඹරීමෙනි. කොහු ලනු ඇඹරීම මෙම ප්‍රදේශයේ ගෘහීය කර්මාන්තයකි. "අතින් ක්‍රියාකරවන මෙම මැෂිමෙන් ලනු ඇඹරීමට තුන් දෙනෙකු අවශ්‍යය යි. නමුත් තුන්දෙනාම දවසක්ම මහන්සි වී උපයන්නේ රුපියල් 60ක් තරම් සුලු මුදලක්. එක් අයෙකුට රුපියල් 20යි. දවසේ වැඩි කාලයක් අපි ගතකරන්නේ සීනි නැතිව තේ කහට ටිකක් පමනක් බීලා" යැයි පැවසීය.

ප්‍රධාන සමාගමක් වන හේලීස් සමාගම විසින් පසුගිය කාලයේ ඔවුන්ගේ කොහු ලනු මිලදී ගනු ලැබී ය. නමුත් මාස හයක පමන සිට සමාගම කොහුලනු මිලදී ගැනීම නතර කර තිබේ. ඇයගේ ස්වාමියා එදිනෙදා ස්වයංරැකියාවල් කරමින් යම් මුදලක් ඉපයීමට උත්සාහ කරයි. "දුප්පත් මිනිස්සුවන අපගේ තත්වය යහපත් කිරීම සඳහා ආන්ඩුව කිසිම දෙයක් කරන්නේ නැහැ. මේ ආන්ඩුව කරන්න යන්නේ මොකක්ද කියලා අපි දන්නෙ නැහැ" යි රංජනී පැවසීය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ උඩුගම ගමේ කථාවද ඊට ම සමාන එකකි. පොහොර සහ ඊට අවශ්‍ය සෙසු නිෂ්පාදනවල මිල ඉහල ගොස් ඇති නිසා ගොවිතැන් කිරීම දුෂ්කර වී ඇති බව ධර්මසේන පැවසී ය. පසුගිය කාලයේ දරුනු නියගයක් තිබුනත් ආන්ඩුව ගොවීන්ට ආධාර කිරීමට ඉදිරිපත් වී නොතිබුනි. "මට කිසිම ඉඩමක් නැහැ. මා වගා කරන්නේ ගමේ පන්සලට අයිති අක්කර එකහමාරක පමන කුඹුරක්. පන්සලේ කොටස ගෙව්වට පස්සේ මට ඉතිරි වෙන්නේ යම්තම් කෑමට පමනක් සෑහෙන සුලු වී කොටසක්. ජීවත්වීම සඳහා කුමක් හෝ එදිනෙදා කුලී වැඩක් කරනවා." ඔහු පැවසී ය.

එජාපෙ ආන්ඩුවේ "දින සීයේ වැඩ පිලිවෙල" යටතේ යම් සහනයක් ලැබෙතැයි සිතාගෙන ඔහු 2001 දී එජාපෙට ඡන්දය දුන්නේ ය. ගොවීන් සහ දුගීන්ට ජීවත් වීම සඳහා මෙම වැඩපිලිවෙල යටතේ සියල්ල සම්පාදනය කරන බවට එජාප ආන්ඩුව මැතිවරනයේ දී පොරොන්දු විය. "නමුත් එය බොරු බලාපොරොත්තුවක් පමනයි. වගාවට අවශ්‍ය නිෂ්පාදනවල මිල අඩුකරන බවට මේ වතාවේ අලුත් පෙරමුන පොරොන්දු වෙලා තියෙනවා." ධර්මසේන පැවසී ය. එහෙත් එම පොරොන්දු ඉටුවෙතැයි ඔහුට විශ්වාසයක් නැත.

එජාපෙ විසින්ම ඉදිරිපත්කල "ශ්‍රී ලංකා යලි පුබුදමු" වැඩපිලිවෙලට අනුව දරිද්‍රතාවය පුලුල්ව පැතිරී ඇත. දක්ෂින ශ්‍රී ලංකාවේ පලාත් හතෙන් හයක සියයට 40ක් දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වෙන බව නිල වශයෙන් සලකනු ලබයි. ඔවුන්ගේ ආදායම දිනකට යන්තම් රුපියල් 30කට වැඩි සහ මාසිකව රුපියල් 950කි. වයඹ සහ ඌව පලාත් දෙකේ වඩාත් ගම්බද ප්‍රදේශවල පිලිවෙලින් ජනගහනයෙන් සියයට 52 සහ 55ක් දරිද්‍රතාවයෙන් පෙලෙති. මෙම ගැමි දුප්පතුන්ට මුදල් හිඟකම පමනක් නොව පිරිසිදු ජලය, සුදුසු සෞඛ්‍ය පහසුකම්, මාර්ග විදුලිබලය සහ මූලික සේවාවන් ද නැත. සීමිත සෞඛ්‍ය සායන සහ පාසල් ද කප්පාදු කර ඇති අතර ආන්ඩුවේ වියදම් කප්පාදු කිරීමේ පිලිවෙත්වල කොටසක් ලෙස බලයට පත්වූ ආන්ඩු විසින් සමහර තැන්වල සෞඛ්‍ය සායනයන් සහ පාසල් වසා දමා තිබේ. දශක දෙකක යුද්ධය මගින් නිවාස, ගොවිපලවල් සහ වනාන්තර විනාශ කර ඇති උතුරු සහ නැගෙනහිර පලාත්වල කොන්දේසි වඩාත් නරක ය.

විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානමගින් පැවැත්වූ මෑත ජනමත අධ්‍යයනයක් මගින් ඡන්ද දායකයන්ගෙන් සියයට 61.6කගේ ඔවුන්ගේ ප්‍රධාන ප්‍රශ්නය ජීවන වියදම ලෙස අනන්‍යකරගෙන ඇති බව සොයාගෙන තිබේ. විරැකියාව තමන්ට ඇති ප්‍රධාන ප්‍රශ්නය බව සියයට 55ක් ප්‍රකාශ කර ඇත.

පුලුල්ව පැතිරී ඇති කෝපය උගුලක සිරකිරීමට අරමුනු කරගෙන මැතිවරනයකට මාස කිහිපයකට පෙර ජවිපෙ හම්බන්තොට, රත්නපුර, පොලොන්නරුව සහ කුරුනෑගල දිස්ත්‍රික්කවල දී ජලය පාලනය කිරීමට සහ ජල සම්පත් විකිනීමට සැලසුම්කර ඇති ජල පනතට එරෙහිව පසුගිය ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී දහස් ගනනක් ගැමි දුප්පත්තුන්ගේ විරෝධතා උද්ඝෝෂන සංවිධානය කලේ ය.

නමුත් ජවිපෙ සහ ශ්‍රීලනිපය දැන් ඊලඟ ආන්ඩුව පිහිටුවීමට සූදානමින් සිටිත්. ගැමි ප්‍රදේශවලට සම්බන්ධ ප්‍රධාන අමාත්‍යාංශ බාරගැනීමට ජවිපෙ විශේෂයෙන් සැලසුම් කරයි. නමුත් පක්ෂ දෙකෙන් එකකට වත් ගැමි ජනයා මුහුන දෙන ප්‍රශ්න විසඳීමේ කිසිදු සැලැස්මක් නැත. 1994 සහ 2001 දී ශ්‍රීලනිපය විසින් නායකත්වය දුන් පොදු පෙරමුනු ආන්ඩුව විසින් ක්‍රියාවට දැමූ බොහෝ ප්‍රතිව්‍යුහකරන පියවරයන් එජාපෙ යටතේ ද දිගටම ක්‍රියාවට දැමූ අතර වඩාත් තීව්‍ර කලේ ය.

බොහෝ ගැමි ප්‍රදේශවල ජනයාට දිවි රැකගැනීම වඩ වඩා අපහසු බව දැනෙන නිසා සමාජ පිපිරීමක් සඳහා වේදිකාව සැකසෙමින් තිබේ. විසඳුම් සඳහා පාලක පන්තියේ එක් හෝ තවත් කොටසක් වෙත හැරෙනු වෙනුවට ගොවීන් සහ ගැමි දුප්පතුන් වෙනත් දිසානතියක් බැලිය යුතු ය. එනම් ඔවුන්ගේ උවමනාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඊහා සමාන සමාජ විනාශයකට මුහුන දෙන කොලඹ සහ සෙසු නාගරික මධ්‍යස්ථානවල වැඩකරන කම්කරුවන් සමග ඒකාබද්ධ අරගලයකට යොමු විය යුතු ය.